"ලෝකයේ ස්ථාවර වන මුදල් ඒකක අතරට රුපියලත්" යන සිරස්තලයෙන් යුතුව, දිනමිණ පුවත්පතේ (මාර්තු 16, 2023) පළ වූ පුවතකි. එම පුවත තුළ පහත ප්‍රකාශයන් දෙක ඇතුළත් විණි.
* "ජාත්‍යන්තර ගනුදෙනු සඳහා හුවමාරු වන මුදල් ඒකක අතර, ශ්‍රී ලංකා රුපියල ද විනිමය මාධ්‍යයක් ලෙස පවත්වාගෙන යෑම පිළිගැනීමකට ලක්ව ඇත."
* "ලෝකයේ ස්ථාවර වන මුදල් ඒකක අතර ශ්‍රී ලංකා රුපියල ද මේ වන විට පිළිගැනීමකට ලක්ව ඇතැයි වාර්තා වේ."
පුවතේ දැක්වෙන මෙම කරුණු දෙක කෙතරම් නිරවද්‍ය දැයි, Ethics Eye අපි පිරික්සා බැලුවෙමු.
* මෙම පළමු කරුණ සඳහා දිනමිණ විසින් මූලාශ්‍ර ලෙසින් දක්වන “Government of the Planets” ට්විටර් පිටුව (652 followers) දේශීයව හෝ ජාත්‍යන්තරව පිළිගත් කිසිදු ආයතනයක් නියෝජනය නොකරයි. එහි සභාපතිවරයා ලෙසින් ශ්‍රී ලාංකික නමක් එම ට්විටර් පිටුවේම දැක්වේ. එසේම මෙම ට්වීට් පණිවුඩය නොවැ. 13, 2022 දින නිකුත් කරන ලද්දක් වේ. එයට Retweet 1 ක් සහ Like 1 ක් පමණක් තිබේ. ඒ හැරෙන්නට, වෙනත් කිසිදු පිළිගත් මූලාශ්‍රයක් මගින් මෙම කරුණ ඉදිරිපත් කොට හෝ සනාථ කොට ඇති බවක් සොයාගැනීමට ද නොහැක.
* මෙම දෙවන කරුණ සඳහා දිනමිණ කිසිදු මූලාශ්‍රයක් ලබා දී නොමැත. කෙසේ වෙතත්, වෙරිටේ රිසර්ච් මඟින් නිකුත් කළ DEBT UPDATE - 17 March 2023 විශ්ලේෂණයට අනුව, "2023 ජනවාරි සිට මාර්තු දක්වා ශ්‍රී ලංකා රුපියල, ගන්නා ලද නියැදියේ අනෙකුත් මුදල් ඒකකයන්ට සාපේක්ෂව සැලකිය යුතු අස්ථාවරත්වයක් පෙන්නුම් කර ඇති අතර, 2023 මාර්තු මාසයේදී ඊට වඩා වැඩි අස්ථාවරත්වයක් පෙන්වා ඇත්තේ පාකිස්තානු මුදල් ඒකකය පමණි". (ශ්‍රී ලංකා රුපියල මෙම වසරේ හොඳම ක්‍රියාකාරිත්වයක් පෙන්වන මුදල් ඒකකය බව බ්ලූම්බර්ග් ලිපියකින් පැවසී ඇත. කෙසේ නමුත්, දිනමිණ පුවතෙහි සඳහන් වන්නේ ශ්‍රී ලංකා රුපියල් එහි ස්ථාවර අස්ථාවර බව සම්බන්ධයෙනි.)
නිරවද්‍ය වාර්තාකරණය යනු මාධ්‍යකරණයේදී රැකීමට සෑම සාධාරණ උත්සාහයක්ම ගත යුතු කොන්දේසියක් වේ. නිරවද්‍ය තොරතුරු වාර්තා කිරීම සඳහා විශ්වසනීය මූලාශ්‍ර භාවිතා කිරීමටත්, බහු මූලාශ්‍ර භාවිතා කිරීමටත්, මාධ්‍ය මාර්ගෝපදේශයන් මගින් මාධ්‍යවේදීන්ට උපදෙස් දෙනු ලැබේ.
1) ඉහත කරුණු අනුව, "ලෝකයේ ස්ථාවර වන මුදල් ඒකක අතරට රුපියලත්" යන සිරස්තලයෙන් යුතු දිනමිණ පුවත, විශ්වසනීය සහ නිරවද්‍ය පුවතක් ලෙසින් ඔබට පිළිගැනීමට හැකිද?
2) මෙවැනි තොරතුරක් ජනගත කිරීමට පෙරාතුව, විශ්වසනීය වෙනත් මූලාශ්‍ර පිළිබඳව සොයා බැලුවේ නම්, මෙම පුවත වඩාත් විශ්වසනීය සහ නිරවද්‍ය ලෙසින් ඉදිරිපත් කිරීමට දිනමිණ පුවත්පතට ඉඩක් තිබෙන්නට ඇතැයි ඔබ නොසිතන්නේ ද?
නිරවද්‍ය සහ විශ්වසනීය වාර්තාකරණය සඳහා මූලාශ්‍ර භාවිතා කිරීම සම්බන්ධයෙන් අප මින් පෙර ඉදිරිපත් කළ උපදෙස් සටහන:
**https://facebook.com/ethicseye/posts/pfbid037RxjLpqwsxXKQiojezrFm6K2jWPv8UPZ1oY6SeTU7ibR4SBHVnbGTF52gvmxwL7xl**
මූලාශ්‍ර:
https://twitter.com/GovPlanets/status/1591808621092163584...
https://www.veriteresearch.org/.../issue-2-17-march-2023.../
https://www.reutersagency.com/en/about/standards-values/...
https://ethicaljournalismnetwork.org/handling-sources
https://www.spj.org/ethicscode.asp
https://www.ndsu.edu/pubweb/~rcollins/431ethics/codes.htm
https://www.bloomberg.com/.../sri-lanka-s-rupee-will...
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# "ලෝකයේ ස්ථාවර වන මුදල් ඒකක අතරට රුපියලත්"?



ලෝකයේ ස්ථාවර වන මුදල් ඒකක අතරට රුපියලත්



2023-03-16


"ලෝකයේ ස්ථාවර වන මුදල් ඒකක
අතරට රුපියලත්"?
ලෝකයේ ස්ථාවර වන...
ලෝකයේ ස්ථාවර වන මුදල් ඒකක අතර ශ්‍රී ලංකා රුපියල ද මේ වන විට පිළිගැනීමට ලක්ව ඇතැයි වාර්තා වේ. ඒ අනුව විදේශ විනිමය හුවමාරු අනුපාතික අතර ශ්‍රී ලංකා රුපියලට පිළිගැනීමක් හිමි වී තිබේ. මේ පිළිබඳව අදහස් දක්වන
Government of the planets on Twitter වෙබ් අඩවිය සඳහන්
සඳහා හුවමාරු වන මුදල් ඒකක අතර ශ්‍රී ලංකා රුපියල ද විනිමය මාධ්‍යයක් ලෙස පවත්වාගෙන යෑම පිළිගැනීමකට ලක්ව ඇති බවය.
2023-03-16
Government of the Planets Retweeted
Government of the Planets · 2022-11-13
The Government of the Planets has approved to use Sri Lanka Rupees as the Main currency to use across the Planets of the Government of the Planets.
#CNN #BBC #ABC #Google #Yahoo #Derana #SriLanka #Hirunews #RanilWickramasinghe #ITN #dailynews #DailyMirror #Reuters #fortune
ETHICS EYE